- **ගැමි නැටුම් පිළිබඳ හැඳින්වීම**

ලෝකයේ සැම රටක ම තම සංස්කෘතිය හා බැඳුණු නැටුම් සම්ප්‍රදායක් ඇත. එමෙන් ම එම රටවල ගැමි ජනතාව විසින් නිර්මාණය කරන ලද හා ඔවුන් අතර භාවිත වූ නැටුම් විශේෂයක් ද වෙයි. ඒවා ගැමි නැටුම් ලෙස හැඳින්වේ. රටක අනන්‍යතාව ද ගැමි නැටුම් මඟින් පෙන්නුම් කරයි. ගැමි ජනතාවගේ සිතුම් පැතුම්, ඇදහිලි, ආගම්, ජීවන වෘත්තීන්, අත්දැකීම් හා විශ්වාස ආදි කරුණු රාශියක් ගැමි නැටුම් මඟින් පිළිබිඹු වේ.

බොහෝ ගැමි නැටුම්වලට පසුබිම් වී ඇත්තේ සමාජීය පසුබිම, ජීවන වෘත්ති හා විනෝදාස්වාදය යි. ඊට අදාළ ගැමි නැටුම් කීපයක් පහත දැක්වේ.

- ලී කෙළි
- කළ
- කුලු
- සවරන්
- පතුරු
- චාමර
- වේවැල්
- ගොයම්
- මෝල්ගස්
- රබන්
- කඩු

- **ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ**

- සරල බව
- සාමූහික බව
- උපකරණ භාවිත කිරීම
- ගායනය සහිත වීම
- එමකම
- විනෝදය

- **සරල බව**

ගැමි නැටුම සඳහා සරල චලන භාවිත කරයි. නර්තනය පිළිබඳ විධිමත් පුහුණුවක් නො ලැබූ කෙනෙකුට වුව ද සහභාගි විය හැකි අයුරින් සරල චලන භාවිත කර නර්තන නිර්මාණය කළ හැකි ය. සරල රංග වස්ත්‍ර, සරල තාල හා බැඳි නාදමාලා හා සරල භාෂාව ඇතුළත් වී තිබීම සුවිශේෂ ලක්ෂණයකි.

- **සාමූහික බව**

ගැමි නැටුම් ඉදිරිපත් කිරීම සඳහා බොහෝ දෙනෙකුගේ සහභාගිත්වය අවශ්‍ය වේ. කණ්ඩායම් වශයෙන් නැටීම මෙහි විශේෂත්වයකි. එකිනෙකා අතර සම්බන්ධතා පවත්වමින් පද නර්තනය සිදු වේ.

- **එමකම**

ගැමි නැටුමක දී උපකරණ භාවිත කරන අතර එම උපකරණ හා බැඳි ක්‍රියාවන් නැටුම මඟින් ඉදිරිපත් කිරීම ගැමි නැටුමේ ස්වභාවය යි.

උදා :
- කළ නැටුම කළයෙන් කෙරෙන ක්‍රියාවන් හා බැඳේ.
- කුල්ලෙන් කරන ක්‍රියාවන් අංග චලන ඔස්සේ නිර්මාණය කිරීම කුලු නැටුමේ දී දක්නට ලැබේ.

මෙම ලක්ෂණ ගැමි නැටුමෙහි දක්නට ලැබෙන එමකම ලෙස හැඳින්විය හැකි ය.

- **විනෝදය**

ගැමි නැටුමකින් විනෝදාස්වාදය ලැබීම එක් අරමුණකි.

## ලී කෙළි නැටුම හා කළගෙඩි නැටුම පිළිබඳ අවබෝධය

- **ලී කෙළි නැටුම**

''කෙළි'' යන වචනයේ අදහස වන්නේ ''ක්‍රීඩාව'' යන්න යි. මෙය පැරණි කාලයේ ක්‍රීඩාවක් ලෙස ද භාවිත කරන්නට ඇත. එහෙත් ලී කෙළිය විනෝද නැටුමක් ලෙස ජේ.ඊ. සේදරමන් මහතාගේ උඩරට නැටුම් කලාව කෘතියෙහි දක්වා ඇත. ලී කෙළි කණ්ඩායම්, විවේක කාලයන්හි දී විහාර මළුවේ හා වලව්වක මිදුලේ නැටූ බව ද එම කෘතියේ ම සඳහන් වේ.

වර්තමානයේ ලී කෙළි නැටුම ගැමි නැටුම් අතර ඉතා ජනප්‍රියත්වයට පත් ව ඇත. මෙම නර්තනයේ දී භාවිත කරනු ලබන කවි ලී කෙළි කවි ලෙස හැඳින්වේ. මෙම කවිවල අන්තර්ගතය දෙස බැලීමේ දී එයට ආගමික ලක්ෂණ ද ඇතුළත් වී ඇති බව පෙනෙයි.

'' බෝ පත්තිනි මට අවසර දෙන්නේ ''
'' සතර වරම් දෙවි සතර දෙනාටයි ''

ඉර හඳ, ගස්වැල් දේවත්වයෙන් සැලකීම, දෙවියන්ගෙන් අවසර ගැනීම, කුල දෙවියන්ට පින් දීම, නමස්කාර කිරීම එදා ගැමියා අමතක නො කළ අතර ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාස මෙම කවිවලින් පැහැදිලි වෙයි. එසේ ම ''ලී මල්ලිය'' භාවිත කිරීම ලී කෙළි නැටුමේ විශේෂත්වයකි. ඒ පිළිබඳ ව කියැවෙන ලී කෙළි ගායන ද ඇත.

ලී කෙළි නැටුමේ දී කණ්ඩායම් දෙකකට බෙදී ලී දෙකක් රැගෙන දෙදෙනා බැගින් සිට ලී ගසමින් රංගනය කිරීම බොහෝ විට දක්නට ලැබේ. ඇම්බැක්කේ දේවාලයේ ලී බාල්කයක දක්නට ඇති ලී කෙළි නැටුමේ දර්ශනය මෙහි පෞරාණික බවට කදිම සාධකයකි.

- **ඇම්බැක්කේ දේවාලයේ දැව කැටයම**



වර්තමානයේ ඉතා අලංකාර ලෙස නිර්මාණය කර ගන්නා ලද ලී කෙළි නැටුම් අපට විවිධ අවස්ථාවල දී දැක ගත හැකි ය. කණුවක් මැදට ගෙන ඒ වටා නර්තනයේ යෙදෙමින් ගෙත්තමක් කර නැවත එය ලිහා දැමීම ලී දඟය සහිත මල්ලියක් ලෙස ව්‍යවහාර කෙරේ. මේ බව උඩරට නැටුම් කලාව කෘතියේ දක්වා ඇත්තේ අටමල්ලිය හා ලණුදඟය ලෙස ය.

## ලී කෙළි කවි

### මාත්‍රා 2 තනි තිත තාලය

| | | |
|---|---|---|
| 1. | එක පඳුරෙන් ලී සයක් කපා | ගෙන |
| | එක උස ඇති සදෙනෙක් තෝරා | ගෙන |
| | ගුරුන් අතට දී ලී බෙදවා | ගෙන |
| | අපිත් කෙළිමු ලී දෙපිල සැදී | ගෙන |

| | | |
|---|---|---|
| 2. | බෝ අත්තට වැඳ සිරස | නමන්නේ |
| | ආපස්සට වැඳ මුන | පෙරළන්නේ |
| | ඒ පැත්තේ අය අප | හඳුනන්නේ |
| | බෝ පත්තිනි මට අවසර | දෙන්නේ |

3. අහසේ දෙවියෝ රැස් ව සිටින්නයි
පොළොවේ දෙවියන් බිම වැදගන්නයි
සතර වරම් දෙවි බලා සිටින්නයි
අද ලී කෙළියෙන් අප දිනවන්නයි

**මාත්‍රා 3 තනි තිත තාලය**

1. ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා
සඳට ඔබිය සඳ වට තරු සිටියා
ලියට ඔබිය සුදු සේලය නෙරියා
අපට ඔබිය සබ මැද ලී කෙළියා

**මාත්‍රා 4 තනි තිත තාලය**

1. රටලින් ඇරලා පටි ගෙන්නාලා දඟරෙට දමලා ගොතන රගේ
ලී ගෙන්නාලා දැතට දීලා පේළිය සැදිලා ගසන රගේ
බෙර ගෙන්නාලා සුරලත් දාලා තාලෙ වදින කොට නටන රගේ
මෙහෙමත් විස්තර බලන්න තිබුණ ලූ පොර මඬලේ ලී කෙළිය වගේ

### කවි පද ප්‍රස්තාර කිරීම

| / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| එ | ක | ප | ඳු | රෙන් | - | ලී | - |
| ස | යක් | - | ක | පා | - | ගෙ | න |
| එ | ක | උ | ස | ඇ | ති | ස | දෙ |
| නෙක් | - | තෝ | - | රා | - | ගෙ | න |
| ගු | රුන් | - | අ | ත | ට | දී | - |
| ලී | - | බෙ | ද | වා | - | ගෙ | න |
| අ | පිත් | - | කෙ | ළි | මු | ලී | - |
| දෙ | පි | ල | සැ | දී | - | ගෙ | න |
| හෝ | | | | | | | |
| බෝ | - | අත් | - | ත | ට | වැ | ඳ |
| සි | ර | ස | න | මන් | - | නේ | - |

- **කළගෙඩි නැටුම :**

ගැමි කාන්තාව විසින් දෛනික ව සිදු කරනු ලබන ක්‍රියාකාරකමක් ඇසුරු කර ගනිමින් නිර්මාණය වී ඇති කළගෙඩි නර්තනය සඳහා ගායනය කරනු ලබන්නේ කළගෙඩි කවි ය. සරල නාද මාලා මෙන් ම සරල තිත් රූප කළගෙඩි කවි ගායනය සඳහා යොදා ගෙන ඇත. දියට යන කාන්තාවන්ගේ ගැමි ලාලිත්‍යය මෙම කවි මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

**කළගෙඩි නර්තනය දැකිය හැකි අවස්ථා :**

- පෙරහැරවල දී
- අවුරුදු උත්සවවල දී
- නිදහස් උත්සවයේ දී
- විවිධ ප්‍රසංගවල දී

### කළගෙඩි කවි

1. පේළි සැදී අඟනෝ සැරසීලා
   නීල වරල කුසුමන් ගවසාලා
   කෝල නොවී සබ මැදට වැදීලා
   බාල ලියෝ කළ පිඹිති සැදීලා